ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය 1 - 2008/09

පරිපාලන නීතිය - **LWU 3311**

කාලය - විනාඩි 40

---

දිනය - 2008.10.13 වේලාව - පෙ.ව. 10.00 - පෙ.ව.10.40 දක්වා

---

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

01. " (අ) කාර්‍යපටිපාටික නීතිය සහ (ආ) හරයාත්මක නීතිය වශයෙන් නීතියේ මූලධර්ම බෙදා ඇත. කාර්‍යපටිපාටික සහ හරයාත්මක නීතිය අතර මූලික වෙනස තවමත් නිරාකරණය වී නැති නිසා නීතියේ මූලධර්ම කාර්යපටිපාටික සහ හරයාත්මක වශයෙන් වර්ගීකරණය කිරීමේ දී ඇතැම් අවස්ථාවල අදහස් වෙනස් විය හැකිය."

(සුනිල් එෆ්. ඒ. කුරේ, ශ්‍රී ලංකාවේ පරිපාලන නීති මූලධර්ම පිටුව 81)

බලාතික්‍රමණ සිද්ධාන්තය ආශ්‍රයෙන් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.

02. නාගරික ප්‍රදේශ සීමාවන් තුළ නේවාසික සහ වාණිජ ගොඩනැගිලි ඉදිකිරීම විධිමත් කිරීම සඳහා සෙරන්ඩිබ් පාර්ලිමේන්තුව විසින් නගර සැලසුම් කිරීමේ පණත සම්මත කර ගන්නා ලදී. මෙම පණත යටතේ අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ තක්සේරු නිළධාරීන් විසින් පණතේ අරමුණු සපුරාලීම සඳහා සිය බලය සහ අභිමතය භාවිත කළයුතු වේ. එකී අරමුණු අතර ගොඩනැගිලි සැලසුම් පරීක්ෂා කිරීම, එම ගොඩනැගිලි සැලසුම් අදාළ රීතිවලට අනුකූල වන බව සහතික කිරීම සහ ඉන් අනතුරුව නේවාසික සහ වාණිජ ගොඩනැගිළි සඳහා බලපත්‍ර නිකුත් කිරීම ද වේ.

ලුණුගම මහ නගර සභාවේ තක්සේරු නිළධාරී සිල්වා මහතා විසින් ඔහුගේ ඥාතියෙකු වන ප්‍රනාන්දු මහතා විසින් ඉදිකිරීමට බලාපොරොත්තු වන මහල් හයකින් සමන්විත නේවාසික තට්ටු ගොඩනැගිල්ල සඳහා අනුමතිය ලබාදෙන ලදී. කෙසේ වුවද තක්සේරු නිළධාරීට මෙම පණත යටතේ අනුමැතිය සඳහා බලය දී තිබුණේ මහල් තුනකින් සමන්විත ගොඩනැගිලි ඉදිකිරීම සඳහා පමණි.

ආසන්න ගුවන්තොටුපළේ ගුවන් තොටුපළ අධිකාරිය විසින් අධි ආරක්ෂිත කලාපය ආසන්නව අනුමතිය ලබාදුන් ගොඩනැගිල්ල පිහිටා තිබීම හේතුවෙන් සහ එය ගුවන් යානා පිටත්වීමේ සහ ගොඩබැස්සවීමේ අවස්ථාවලදී ගුවන් යානාවල ආරක්ෂාවට තර්ජනයක්ය යන පදනම මත සිල්වා මහතාගේ තීරණයට විරෝධය දක්වයි. ගුවන්තොටුපළ අධිකාරිය සිල්වා මහතාගේ තීරණය අභියෝගයට ලක් කිරීමට බලාපොරොත්තු වේ.

අධිකාරියට උපදෙස් දෙන්න.

- හිමිකම් ඇවිරිණි. -